# වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ පිළිබඳ වාග් විද්‍යාත්මක අධ්‍යයනයක්

# A LINGUISTICS STUDY OF THE VEDDA'S LANGUAGE'S BASIC LANGUAGE FEATURES

**R.M.W.G. Pradeepa Rajanayaka**

Asst. Lecturer at Department of Languages, South Eastern University of Sri Lanka

Pradeeparajanayaka90@gmail.com

## පර්යේෂණ සංක්ෂිප්තය

වැදි භාෂාව නූතනයේ දී මාතෘ භාෂාවල දැඩි බලපෑමට ලක්වුවත් එහි ස්වාධීනත්වය හඳුනාගත හැකි අවස්ථාවක් ලෙස වැදි භාෂාවෙහි මූල භාෂාත්මක ලක්ෂණ දැක්විය හැකි ය. බොහෝවිට වැදි භාෂාවෙහි ප්‍රභවය සම්බන්ධයෙන් ජර්මන් ජාතික රුඩොල්ෆ් විර්චෝ, සෙලිස්මාන් යුවල හා නන්දදේව විජේසේකර, ඊ.ඇම්. රත්නපාල, දයානන්ද බිනරගම වැනි විද්වතුන් අතින් පර්යේෂණයන් සිදු වී ඇත. එහෙත් එම අදහස් එකිනෙකට පරස්පර වන අතර වැදි භාෂාවෙහි මූල භාෂාත්මක ලක්ෂණ කෙසේ ද, එහි භාවිතය කෙබඳු ද, රූපයක් ලෙස වැදි භාෂාවටම ආවේණිකව පවතින්නේ කෙසේ ද, රූප විකාශය කෙසේ සිදු වී ද යන්න පිළිබඳ විධිමත් පර්යේෂණයක් සිදු වී නොමැත. එබැවින් කලක් විවිධ අධ්‍යයනයන්ට හේතු වූ වැදි භාෂාව පැවැති සහ පවතින ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක අවශ්‍යතාවය මතු විය. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍ර ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය, (දිඹුලාගල, දළුකාන), සම්මුඛ සාකච්ඡා දැක්විය හැකි අතර ද්විතීයික මූලාශ්‍ර වශයෙන් පුස්තකාල පරිහරණය හා ග්‍රන්ථ පරිශීලන අධ්‍යයනය පෙන්වා දිය හැකි ය. වාර සඟරා, පුවත්පත්, අන්තර්ජාලය, හා දේශන සටහන් තෘතීයික මූලාශ්‍ර වේ. වැදි භාෂාව 19 වන සියවසේ දෙවන භාගයේ දී ලෝකයාගේ විශේෂ අවධානයට යොමු වූ අතර එය ස්වාභාවික පරිණාමයේ ඵලයක් ලෙස පවතින අදටත් ස්වාධීනව පවත්නා භාෂාවකි. විශේෂයෙන් වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ නිර්මාණය සඳහා දේශජ භාෂා වල දායකත්වය ඉතා ප්‍රභලව ලැබී ඇත. එමෙන්ම අවිඥානිකව සිදු වී ඇති වෙනස්කම් හා හිතාමතා කරන ලද වෙනස්කම් වැදි වහරට එක් වී ඇති බව ද පෙනේ.

**ප්‍රමුඛ පද:** වැදි භාෂාව, මාතෘ භාෂා, මූල භාෂාත්මක ලක්ෂණ, පරිණාමය

## හැඳින්වීම

ආදිවාසීන් යනු වැදි ජනතාවයි. දඹාන, දිඹුලාගල, හෙන්නානිගල, පොල්ලේබැද්ද, රතුගල, දළුකාන සහ වාකරේ දැනට වැදි ජනයා ජීවත් වන ප්‍රධාන ප්‍රදේශ ලෙස සඳහන් කළ හැකි ය. ලෝක ආදිවාසීන් අතුරින් ශ්‍රී ලංකාවේ වැදි ජනයාට හිමි වන්නේ සුවිශේෂී වූ ස්ථානයකි. මේ නිසා වැද්දෝ යනු අභිමානවත් මානව ඉතිහාසයකට උරුමකම් ඇත්තෝ වෙති. මෙම වැදි ජනතාවටම ආවේනික වූ භාෂාවක් වන වැදි භාෂාව ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන ඉතා සුවශේෂී වූ අන්තර් භාෂාවකි. වැද්දන්ගේ ආරම්භය, පරිණාමය, විකාශනය හා වඳ වී යෑමට හේතු වූ කරුණු පිළිබඳ සොයා බැලීම බොහෝ විද්වතුන් සිදු කොට ඇත. එහෙත් වැද්දන්ගේ භාෂාව පිළිබඳ වාග් විද්‍යාත්මක පර්යේෂණයන් සිදු ව ඇත්තේ ඉතාම සුළු වශයෙනි. එම නිසා වැද්දන්ගේ භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ පිළිබඳව කතා කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කොට ඇත.

## පර්යේෂණ ගැටලුව

විශේෂයෙන් අප මෙහි දී මූලික පර්යේෂණ ගැටලුව ලෙස හඳුනාගනු ලබන්නේ වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ නිර්මාණය සඳහා දේශජ භාෂා වල දායකත්වය කෙසේ සිදු වීද යන්න අධ්‍යයනය කිරීමයි.

**පර්යේෂණයේ වැදගත්කම**

මෙම පර්යේෂණයේ වැදගත්කම පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන්ම කිව යුතු කරුණක් වන්නේ දඹානේ හා වෙනත් ප්‍රදේශ වල වසන වැදි ජන බස පිළිබඳ මේ වන විට අධ්‍යයනයන් රැසක් සිදු කර ඇතත් දිඹුලාගල හා දළුකාන වැදි ජන බස එතරම් දුරට වියත් අවධානයට යොමු වී නැති හෙයින් මේ පිළිබඳ විවිධ කරුණු සහිතව වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ පිළිබඳ වාග් විද්‍යාත්මකව පර්යේෂණයක් සිදු කිරීම මෙහි දී සිදු විය. එහෙයින් වැදි භාෂාවේ මූල භෂාත්මක ලක්ෂණ පිළිබඳ වාග් විද්‍යාත්මක පැතිකඩ ඔස්සේ අධ්‍යයනයට ලක් කරන හෙයින් මෙම පර්යේෂණය එහිලා ඉතාම වැදගත් කොට සැලකිය හැකි ය. එමෙන්ම එක්තරා ආකාරයක ක්‍රියෝලයක් වන මෙම වැදි භාෂාව ආගන්තුක ප්‍රතිපක්ෂ භාෂකයින් දෙදෙනෙකු අතර බිහිවන පොදු කාර්ය භාෂාව ලෙස පිජිනය නිර්මාණය වී එම පිජිනය පාරම්පරිකව කිසියම් භාෂක සමාජයක මවු භාෂාව වීම හේතුවෙන් නිර්මාණය වන ක්‍රියෝලය අධ්‍යයනයේ දී ඉතාම වැදගත් වේ.

**පර්යේෂණයේ අරමුණු**

වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ නිර්මාණය පිළිබඳ වාග් විද්‍යාත්මකව අධ්‍යයනයට ලක් කිරීම හා වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ වැනි ඉතා වැදගත් අධ්‍යයනයෙන් ගිලිහී ගිය පැතිකඩක් සම්බන්ධයෙන් සජීවී පර්යේෂණ වාර්තාවක් සකස් කිරීම.

**ක්‍රමවේදය**

මූලිකව ප්‍රථම භාෂා සංස්පර්ශය පිළිබඳ අධ්‍යයනය කර ඇති හෙයින් විශේෂයෙන් පොත්පත්වල සඳහන් භාෂාමය හා සංස්කෘතිමය තොරතුරු හා මූලාශ්‍රයන්හී අන්තර්ගත තොරතුරු මෙන්ම දෙස් විදෙස් විද්වතුන් විසින් සිදු කළ පර්යේෂණ වාර්තාවල තොරතුරු ද මේ සඳහා භාවිත කර දෙවනුව මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකාවේ දිඹුලාගල හා දළුකාන ප්‍රදේශයන්හී ජීවත් වන වැදි භාෂකයින් යොදා ගත් අතර මාතෘකාවට අනුයුක්තව දත්ත විශ්ලේෂණය කිරීමේ දී එය ප්‍රධාන අදියර දෙකක් ඔස්සේ සිදු කොට ඇත. එනම් ප්‍රායෝගික ක්‍රමවේදය හා න්‍යායාත්මක ක්‍රමවේදය යි. ඒ අනුව ප්‍රායෝගික ක්‍රමවේදය යටතේ මූලික අදියර හතරක් ඔස්සේ පර්යේෂණය සිදු කොට ඇත. එනම් දත්ත හඳුනා ගැනීම, දත්ත එකතු කර ගැනීම, දත්ත විශ්ලේෂණය කිරීම හා නිගමනය වශයෙනි. දත්ත හඳුනා ගැනීමට නම් මූලාශ්‍ර පරිශීලනය කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු වේ. ඒ අනුව මෙහි දී යොදා ගත් ප්‍රධාන මූලාශ්‍රයන් අතර ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් වැදි භාෂකයින් පිළිබඳ කුමන හෝ සටහනක් දක්නට ලැබෙන සියලුම කෘති මේ ගණයට ගත් අතර උදාහරණයක් ලෙස පුවත්පත් ලිපි, ශබ්දකෝෂ, විදේශීය වාර්තා ඉන් සමහරකි. ද්විතීයික මූලාශ්‍ර ලෙස සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයන හා සංයුක්ත තැටි ප්‍රධාන වශයෙන් දිඹුලාගල හා දළුකාන ප්‍රදේශයන් හී වැදි භාෂකයින්ගෙන් ලබා ගත් තොරතුරු පදනම් කොට ගෙන පර්යේෂණය සිදු කොට ඇත. විශේෂයෙන්ම මෙම අධ්‍යයනයෙහි සජීවී භාෂක සමාජයක් වන වැදි භාෂකයින්ගේ තොරතුරු සඳහන් වන බැවින් මෙම පර්යේෂණය ප්‍රායෝගික ක්ෂේත්‍ර අධ්‍යයනයක් ලෙස ගැනීම නිවැරදි වේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

වැද්දා යන්න බැද්දා යන වචනයෙන් බිඳී ආවකි. ව්‍යාධ, පුලින්ද, සබර යන නම් ද වැද්දා හැඳින්වීම සඳහා ව්‍යවහාර වේ. සිංහල සාහිත්‍යයේ වැද්දන් හැඳින්වීමට යොදා ඇති වචන ගත් විට මලදරු (ගිරිවැසි), වනසර (වනචාරි/වන්‍යවාසි), සැරව් (ඊතල දරන්නා) යන අරුත් දක්වා ඇත. කොතෙක් වචන තිබුණ ද

වැද්දන් විසින් තමුන් හඳුන්වා ගනු ලබන්නේ වන්නියලැත්තන් ලෙසිනි. වැදි ජනයාගේ ආරම්භය පිළිබඳ කතා කිරීමේ දී විජය කුවේණි කතාව ඉතාම වැදගත් වේ. ඒ අනුව වැදි ජනයා ජීවහත්ත හා දිසාලගෙන් පැවත එන බව කියවේ. ආරම්භයේ දී වැදි භාෂාව සිංහල භාෂාවේ උප භාෂාවක් ද නැතිනම් එය ස්වාධීන ස්වභාවික භාෂාවක් ද යන්න භාෂාවේදීන් අතර සැලකිය යුතු වාදයක් තිබිණි. පසුව කරනු ලැබූ අධ්‍යයනයන්ගෙන් පෙනී යන්නේ වැදි භාෂාව ඈත අතීත කාලයේ සිට ක්‍රමයෙන් පරිණාමය වූ මිශ්‍ර භාෂාවක් ලෙසට ය. අතීතයේ දී සිංහලයන් සමඟ සමීප සම්බන්ධතා ඇති කරගත් කාලයේ සිට වැදි ජනයා සිංහල වචන හා සංස්ලේෂක ගති ගුණ තාවකාලික භාවිතයට ගැණුනු අතර මෙම ගති ලක්ෂණ එකතු වීමෙන් වැදි භාෂාව සිංහල භාෂාවට සමාන ආකාරයක් ගත්තේ ය. නමුත් ව්‍යකරණ වශයෙන් වෙනසක් ඇති නොවුනි. මුල් වැදි භාෂාවේ මූලාරම්භය පිළිබඳ නිශ්චිත ප්‍රභවයක් සොයා ගත නොහැක. සිංහල භාෂාව ඉන්දු ආර්ය හා ඉන්දු යුරෝපීය භාෂා වල කොටසකි. උච්චාරණය කරන ආකාරය අනුව වැදි භාෂාව හා සිංහල භාෂාව වෙන්කර හඳුනාගත හැකි ය. 'ච' හා 'ජ' වැනි උස් සංඛ්‍යාත සහිත තාලුජ ශබ්ද වැදි භාෂාවේ දක්නට ලැබේ. වචන අවසානයට භාවාත්මක නොවන වචන යොදා ගැනීම ද දැකිය හැකි ය. වැදි භාෂාව තුළ නාම පද ක්‍රියා පද සහ ප්‍රාණවාචී නාම පද වල ලිංග භේදය හඳුනා ගැනීම ද දැකිය හැකි ය. සිංහල භාෂාවේ ලක්ෂණයක් වන මධ්‍යම පුරුෂ සර්ව නාම වැදි භාෂාවේ දක්නට නොමැති අතර  අර්ථයේ යෙදීම මත ඒවා වැදි භාෂාවට ආරෝපණය වී ඇත. සිංහල හෝ අනෙකුත් භාෂා වල යොදා ගැනීම වෙනුවට සීමිත වචන මාලාවක් තුළ වැදි භාෂාව රැඳී සිටී. තව ද 06 වන සියවසේ සිට 12 වන සියවස දක්වා පැරණි සිංහල වචන මොවුන් යොදා ගෙන ඇත. එමෙන්ම වැදි භාෂාව තුළ සිංහල භාෂාවට සමපූර්ණයෙන්ම වෙනස් ආවේණික වචන පවා දක්නට ලැබේ. වැදි භාෂාවට සිංහල භාෂාවෙන් සුළු බලපෑමක් සිදු වී ඇති බව විවාදපන්නය. එය පැහැදිලි වන්නේ වැදි පද මාලා හා ව්‍යුහාත්මක ලක්ෂණ ඉන්දු ආර්ය හා ද්‍රවිඩ භාෂා වල දැකිය නොහැකි වීමයි.

වැදි භාෂාව අලිඛිතය. එනම් වැදි භාෂාව ලියා දැක්වීම සඳහා අක්ෂර මාලාවක් දක්නට නැත. එහෙයින් ඔවුන්ට ඇත්තේ ඔවුන් විසින්ම නිපදවා ගන්නා ලද වචන මාලාවකි. එම වචන මාලාව තම පිරිස තුළ පමණක් ව්‍යාප්ත කර ගනී. ඒවා ඉතාම සංක්ෂිප්ත වන අතර වචන ප්‍රමාණය ඉතා සීමිතය. එමෙන්ම එය පරම්පරාවෙන් පරම්පරාවට විකාශනය වූවකි. වැදි භාෂාවේ සුලභව භාවිත වන වචන වන්නේ ඇත්තෝ, පොජ්ජ, මන්දො වෙනවා, කොදුයි යන වචන ය. එමෙන්ම වැදි භාෂාවට ලිංග භේදයක් ඇත. ඒ අනුව පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග හා නපුංශක ලිංග වචන වැදි භාෂාවේ අපට හඳුනාගත හැකි ය. වැදි භාෂාවේ දක්නට ලැබෙන පුරුෂ ලිංග පද ලෙස අප්පුවා, කළුවා, කන්දා, කිරි බණ්ඩියා, තිසාහාමි, දවුටා, පොරමලා, බුරදා, වන්නියා, මිල්ලානා, බණ්ඩියා, හීන් බණ්ඩා, හඳුනා, රන්දුනා. ස්ත්‍රී ලිංග පද ලෙස ඌරි, කිරි ගෝමරි, තන්දි, දවුටී, දෙමටී, බුරටී, සුවඳි, මිලිලි, මුතු, රනී, කදිරි යන ඒවාත් ක්‍රියා පද ලෙස කැවිල්ලානවා, මංගච්චනවා, ඇනළකාලනවා යන පද හඳුනාගත හැකි ය.

වැද්දන්ගේ භාෂාවේ සම්භවය ගත් විට වැදි භාෂාවට පුරාණ සිංහල වචන එක් විය. ඉන් පසු ගුප්ත වචන රාශියක් පිළියෙළ විය. පුරාණ වචන වෙනුවට නවීන වචන ඇති විය. වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරන විට පාළි, සංස්කෘත, දෙමළ, ඉංග්‍රීසි හා සිංහල ආර්ය භාෂාවේ හෝ සිංහල භාෂාවේ නොතිබුණ සිංහල ප්‍රකෘති හරහා වචන එකතු ව ඇති බව පෙනේ. පාලි භාෂාවෙන් එකතු වූ වචන ලෙස,

| වැදි බස | පාළි |
|---|---|
| ඇඹුල් මැයි | අම්ල |
| පැඟිරි කොළ | තාම්බූලම් |
| අයිදණ්ඩ | හස්තය |
| හඩ | උදරම් |

| වැදි බස | සංස්කෘත |
|---|---|
| ශබර | ෂබර |
| චක්‍ර | සකොලව |

වැදි භාෂාවේ වචන අතුරින් දෙමළ භාෂාවට නෑකම් කියන වචන ගත් විට,

| වැදි බස | දෙමළ බස |
|---|---|
| ඔක්මා | උක්කම් |
| මොලා | මෝලෙයි |
| කෝලි | කොල්ලෙයි |
| චකොළව | ෂක්කරම් |

හෙළ වහරේ 'ස' ශබ්දය වැදි බසෙහි 'ච' බවට පත්ව තිබෙන අයුරු ද දක්නට ලැබේ. ඉච්චට පච්චට- ඉස්සරහට පස්සට, මැච්චිල ඇත්තෝ - මැස්සෝ, ඉච්චර කාලේ පොජ්ජ- ඉස්සර කාලේ, පච්චට පච්චට - පස්සට පස්සට. සිංහල භාෂාවෙන් බිඳී ආ වචන ලෙස හනිකට- හනිකෙට, මගේම- මයිඑමෙ, අරන්- අරන්ග්, පැන නැංගේ-පෙනෙ, ඒක-ඒකෙ. වැදි බසට අළුතින් එක්වුණු වචන ලෙස පෝලිම් පොජ්ජ, පෙළපාලි පොජ්ජ, ටැක්ටර් පොජ්ජ, දිස් පැන්සල් පොජ්ජ, බැංකු පොජ්ජ යන වචන හඳුනා ගත හැකි අතර විශේෂයෙන්ම මෙම අලුත් වචන නිපදවා ගැනීමේ දී වස්තූන්ගේ බාහිර ලක්ෂණ කෙරෙහි සැලකිල්ලක් දක්වා ඇත. පාරම්පරික වැදි වචන වල මෙම ලක්ෂණය දක්නට නැතැයි එයින් අදහස් නොකෙරේ. සෘජුවම දක්නට නොලැබුණත් විකාශනය වීමට පෙර තත්ත්වය විමසීමට ලක් කරන කළ වචන වල නිෂ්පත්තිය කෙරෙහි වස්තූන්ගේ බාහිර ස්වභාවයේ බලපෑම දක්නට ඇත.

සිංහලයේ දී සියලු කාරක වාක්‍යයන් සත්‍යාර්ථයේ හෝ අසත්‍යාර්ථයේ වේවා අතීත අනතීත කාල දෙකට යටත් වෙනමුත් වැදි බසෙහි සත්‍යාර්ථයෙහි කාල 3ක් දැක්වේ. සිංහල ආදේශක සංඛ්‍යා වෙනසක් ඇති නමුත් වැදි භාෂාවෙහි අංක කිරීමක් නැත. වැද්දන්ගේ වාචික සහ වෙන් කිරීමක් නැත. වැද්දන්ගේ වාචික සහ නාමික විචලනය සිංහලයන්ට සමාන ලෙස පෙනුන නමුත් එක ලෙස සමාන නොවේ. වැදි බසෙහි ප්‍රාණවාචී පද වලට ද ලිංග භේදය යෙදේ. වැදි බසෙහි ශබ්ද මාලාව හෙළයට බොහෝ සේ සමානකම් දැක්වුවද භාෂා ක්‍රම අතින් එබස හෙළයෙන් බොහෝ දුරස් වේ. එමෙන්ම 'ච' වර්ගයේ තාලුජ ගතකුරු වැදි බසෙහි සියලු තන්හී දක්නට ලැබේ.

| සිංහල | වැදි භාෂාව |
|---|---|
| ඉස්සර | ඉච්චර |
| පොඩ්ඩ | පොජ්ජ |

මෙම බස තවදුරටත් වර්ණවත් වන්නේ හෙළ බසින් උපුටාගත් වදන් අගට පොජ්ජ, ගෙජ්ජ හා රච්චා වැනි අව්‍ය පද භාවිත කිරීම නිසා ය.

| සිංහල | වැදි භාෂාව |
|---|---|
| බර | බරපොජ්ජ |
| ඇස | ඇපෙජ්ජ |
| හිස | ඉස්පොජ්ජ |
| වතුර / දිය | දියරච්ච |

මුල් කාලයේ ප්‍රමුඛව සිටි වැදි නාමපද ප්‍රාණවාචි හා අප්‍රාණවාචි වශයෙන් උපසර්ග දෙකකින් යුතු විය. සප්‍රාණික උපසර්ග ලෙස ඇත්තෝ පුද්ගලික සර්වනාම සඳහා ලැත්තෝ අන් සප්‍රාණික නාමයන්ට පොජ්ජ හා රාක්කා පුද්ගලායිත නාමවලටද යෙදේ. නිදසුන් ලෙස දෙයියලැත්තෝ - දෙවියන්, පන්නිලැත්තෝ - ගැඩවිලා, මෙයැත්තෝ - මම හෝ අපි, ඉරපොජ්ජ - සූර්යයා, ගිනිරච්චා - ගින්දර ආදිය පෙන්වා දිය හැකි ය. වැදි භාෂාවේ වචන හුදෙක්ම සිංහල භාෂාවෙන් හෝ දමිළ භාෂාවෙන් ගත් ඒවා ය. සිංහල භාෂාවෙත් සිංහල නොවන වචන ඉන්දු ආර්ය භාෂා කණ්ඩායම් වලින් පැවත එන ඒවා ය. නව වදනක අවශ්‍යතාව පැන නැගුණු පමණින් තම අවට භාෂා වල පිහිට නොපතා තම සීමිත වචනාර්ථ වල උපරිම ප්‍රයෝජන ගෙන ඒවා එකට අමුණා නව වදන් තැනීමේ අපූර්ව ක්‍රමයක් වැදි බස සතුය. තවදුරටත් හෙළයේ පාවිච්චි නොකරන ඉපැරණි වදන් සමහරක් වැදි බසේ රැඳී පවතී. සිංහල භාෂාවෙත් සිංහල නොවන වචන ඉන්දු ආර්ය භාෂා වලින් පැවත එන ඒවා ය. මෙම පෞරාණික වචන අතීත සිංහල භාෂාව හා බැඳී තිබෙන්නට ඇති බවත් මෙම වචන වලින් සමහරක් සිංහල භාෂාවට ද එකතුවන්න ඇතැයි විශ්වාස කෙරේ. උදාහරණ ලෙස,

''දෙවුල වැදි බසින් අහස යනරුත් දුන්න ද 10 වන සියවසේ හෙළ අරුත් විවරණ ග්‍රන්ථය වූ දම්පිය අටුවා ගැටපදයෙහි එය වලාව යනරුත් දෙන බැව් රචිතය''

''දියමච්ච මාපු යනරුත් දෙන වැදි වදන දියමස් යන 10 වන සියවසට අයත් ග්‍රන්ථයක් වූ සිඛවලද ග්‍රන්ථයේ දී ඇති අරුතට සමානය''

''මන්ද ළග හෝ සමග යනරුත් දේ 12වන සියවසෙහි බුත්සරණ ධර්ම වර්ණනාවෙහි මෙය ඇතුළත්ය''

''කෝමන්තාන යමකිසි පළඳනාවක් ගැන සඳහන් වේ. සිංහල බසෙහි මෙයට කොනම ලෙස භාවිත කරයි. මෙය උම්මග්ග ජාතකයේ සඳහන් වේ. කෝමනම් දමිළ භාෂාවේ වැදි ජනතාව අතීතයේ දී පැළඳි වස්ත්‍රයක් ලෙස කියවේ''

සීමිත වදන් වැලකින් සමන්විත යැයි බැලූ බැල්මට පෙනෙන වැදි බස එය වහරන ජනතාවට අවශ්‍ය ඕනෑම අදහසක් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් වූත් අවශ්‍ය විටක අලුත් වදන් නිපදවා ගත හැකි වූත් සූඛනම්‍ය ගුණයෙන් හා කාව්‍යමය ලක්ෂණ වලින් හෙබි බසක් බව මෙම අධ්‍යනයෙන් පසක් විය. මේ දිවයිනේ මුල්ම පදිංචිකරුවන්ගෙන් පැවත එන ජනතාවක් සේ සැලකිය හැකි වැදි ජනයාගේ සංස්කෘතිය මෙන්ම බස ද තව තවත් විද්‍යානුකූල පර්යේෂණයන්ට ලක්විය යුතු ය. නැතහොත් අනාගත පරම්පරාවට වැදි ජනතාව පිළිබඳ පොත පතින් විනා පසුබිමෙන් දැක ගැනීමට නොමැතිව වද වී යනු නියත ය.

**නිගමනය**

දිඹුලාගල හා දළුකාන වාසී වැදි භාෂකයින්ගේ භාෂා භාවිතයේ සමාජ, සංස්කෘතික හා ආගමික කටයුතුවල දී වැදි භාෂාව එලෙසම භාවිත වේ. විශේෂයෙන් වැදි භාෂාවේ මූල භාෂාත්මක ලක්ෂණ නිර්මාණය සඳහා දේශජ භාෂා වල දායකත්වය ඉතා ප්‍රභලව ලැබී ඇත. වැදි සංස්කෘතිය තුළ ඉස්මතු වී පෙනෙන විශේෂත්වයන් ඇත. එමෙන්ම මේ වන විට වැදි භාෂාව හා සංස්කෘතිය සමාජ නවීකරණයට භාජනය වීම මත යම් අවධානමකට ලක්ව ඇති බවත් මෙම පර්යේෂණය මඟින් අනාවරණය විය.

**විමර්ශිත ග්‍රන්ථ**


- දිසානායක ජේ. බී. මානව භාෂා ප්‍රවේශය, කොළඹ; ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම, 2005.
- පෙරේරා නිස්සංක, වැද්දෝ ,කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ ,2009.
- රත්නපාල ඊ.එම්. ලංකාවේ වැද්දෝ, බණ්ඩාරගම, 1978.
- රණසිංහ චන්ද්‍ර ශ්‍රී, වැද්දෝ ,කොළඹ 10: ෆාස්ට් පබ්ලිෂින් ලිමිටඩ්, 2009.

- වීරසේකර තිස්ස, දිඹුලාගල වැදි බස, කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ ,1996.
- සුගතපාල ඩබ්.එම්. දඹානේ වැදි බස, සරසවි ප්‍රකාශකයෝ, 1964.
- Denscombe Martyn (1999) The Good research Guide, Viva books PVT Ltd, India.
- Uyangoda, Jayadewa, Social Research (Philosophical and Mythological Foundations), Social Scientists Association, Colombo 5, 2015.